# සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

## සබරගමුව පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ පළාත් ආයුර්වේද කොමසාරිස් තනතුර සඳහා අයදුම්පත් කැඳවීම.

සබරගමුව පළාත් රාජ්‍ය සේවය යටතේ පුරප්පාඩුව පවතින පළාත් ආයුර්වේද කොමසාරිස් තනතුර සඳහා සුදුසුකම්ලත් නිලධාරීන්ගෙන් දීපව්‍යාප්තව අයදුම්පත් කැඳවනු ලැබේ.

| අනු අංකය | තනතුර | අවශ්‍ය සුදුසුකම් | පුරප්පාඩු සංඛ්‍යාව | පුරප්පාඩු පවතින සේවා ස්ථානය |
|---|---|---|---|---|
| 01. | සබරගමුව පළාත් ආයුර්වේද කොමසාරිස් තනතුර | ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ පරිපාලන I ශ්‍රේණියේ නිලධාරියෙකු වීම. | 01 | පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව සබරගමුව පළාත |
| සටහන :- අයදුම්පත් භාරගන්නා අවසාන දිනය (2024.06.20) වන විට මෙම තනතුරට බඳවා ගැනීමට අදාළ සියලුම සුදුසුකම් සපුරා තිබිය යුතු අතර, සුදුසුකම් සනාථ කෙරන සියලුම සහතිකපත්වල ඡායා පිටපත්, ජාතික හැඳුනුම්පතේ හා උප්පැන්න සහතිකයේ ඡායා පිටපත් අයදුම්පත සමග අමුණා එවීම අනිවාර්ය වේ. | | | | |

**01. මූලික සුදුසුකම් :-**

1) ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ පරිපාලන I ශ්‍රේණියේ නිලධාරියකු විය යුතු ය.
2) අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර 05 තුළ කිසිදු විනයානුකූල දඬුවමකට යටත් නොවූ අයෙකු විය යුතු ය.
3) අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර 05 ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් තිබිය යුතු ය.
4) අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර 05 ක කාලය තුළ කාර්ය සාධන ඇගයීම සතුටුදායක මට්ටමින් හෝ ඉන් ඉහල මට්ටමකින් පැවතිය යුතු අතර, එම වර්ෂ වලට අදාළව වැටුප් වර්ධක සියල්ල උපයාගෙන තිබිය යුතු ය.
5) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.

සටහන :- අයදුම්පත් කැඳවන අවසාන දිනය වන විට තනතුරට අවශ්‍ය සියලුම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.

**02. වැටුප් පරිමාණය :-**

මෙම තනතුරට හිමි වැටුප් පරිමාණය රා.ප.ච. 03/2016හි SL 1 - 2016 - රු 47,615 - 10x1335 - 8x1630 - 17x2170 - 110895/= වේ. එම වැටුප් පරිමාණයෙහි 20 වන වැටුප් පියවර ආරම්භක වැටුප වේ.

**03. වයස් සීමාව :-**

දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු ආයුර්වේද වෛද්‍ය නිලධාරීන් වෙතින් පමණක් දීපව්‍යාප්තව අයදුම්පත් කැඳවා ඇති බැවින් වයස් සීමාවක් අදාළ නොවේ.

**04. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :-**

මූලික සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටිය යුතු අතර, එහිදී ජ්‍යෙෂ්ඨතාවය, කුසලතාවය හා ආයුර්වේද වෛද්‍ය සේවයට ඉටු කර ඇති සුවිශේෂිය දායකත්වයද, කළමනාකරණ හැකියාවද සැලකිල්ලට ගෙන ලකුණු ලබා දෙනු ලැබේ. ඉහළම ලකුණු ලබාගන්නා අයදුම්කරු තනතුර සඳහා බඳවා ගනු ලැබේ.

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී පහත පරිදි ලකුණු ලබාදෙනු ලැබේ.

ජ්‍යෙෂ්ඨතාවය - ලකුණු 50
කුසලතාවය - ලකුණු 50

CamScanner

**05.** සියලුම අයදුම්පත් විධිමත්ව හා නිවැරදිව සම්පූර්ණ කර 2024.06.20 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන ලෙස දෙපාර්තමේන්තු ප්‍රධානියා සහ අදාළ අමාත්‍යාංශ ලේකම් මගින් (පළාත් සභාවට අන්තර්ග්‍රහණය වූ නිලධරයෙකු නම් ඔබගේ අයදුම්පත පළාත් අමාත්‍යාංශ ලේකම්ගේ හා ප්‍රධාන ලේකම්ගේ නිර්දේශ සහිතව යොමු කළ යුතු ය.) "**ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, සබරගමුව පළාත, පළාත් සභා සංකීර්ණය, නවනගරය, රත්නපුර**" යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත් බහාලන ලිපි කවරයේ වම්පස ඉහළ කෙලවරේ "**සබරගමුව පළාත් ආයුර්වේද කොමසාරිස් තනතුර සඳහා අයදුම්පත් කැඳවීම**" යනුවෙන් සඳහන් කළ යුතුය. නියමිත දිනට පසු ලැබෙන අයදුම්පත්, අසම්පූර්ණ අයදුම්පත් සහ අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට නියමිත සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන්ගේ අයදුම්පත් පූර්ව දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් ප්‍රමාද වීම හෝ නැතිවීම පිළිබඳ කිසිදු පැමිණිල්ලක් සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය විසින් භාර ගනු නොලැබේ.

**06.** මෙම බඳවා ගැනීම සම්බන්ධයෙන් මෙහි විධිවිධාන සලසා නොමැති කරුණු පිළිබඳ තීරණ ගැනීමේ බලය ද, මෙම තනතුර සඳහා බඳවා ගැනීම සම්බන්ධයෙන් වන අවසාන තීරණය ද සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වන්නේ ය.

**07.** මෙම දැන්වීමේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් පරස්පරතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුවේ.

මෙයට,
සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ඊ.කේ.ඒ. සුනීතා
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
සබරගමුව පළාත.
2023.06.03.

ඊ.කේ.ඒ. සුනීතා
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
සබරගමුව පළාත

## සබරගමුව පළාත් ආයුර්වේද කොමසාරිස් තනතුර සඳහා අයදුම්පත.

01. සම්පූර්ණ නම :- ..............................................................................................

02. මුලකුරු සමඟ නම :- ..............................................................................................

03. රාජකාරී ලිපිනය :- ..............................................................................................

04. පෞද්ගලික ලිපිනය :- ..............................................................................................

05. උපන් දිනය :- .................................... 2024.06.20 දිනට වයස -: ................

06. ස්ත්‍රී / පුරුෂ භාවය :- ..........................................

07. ජාතික හැඳුනුම්පත් අංකය :- ..........................................

08. දුරකථන අංකය රාජකාරී :- .................................. ජංගම :- ........................................

09. මුල් පත්වීම් දිනය :- ..........................................

10. සේවය ස්ථිර කළ දිනය :- ..........................................

11. පරිපාලන II ශ්‍රේණියට උසස් කළ දිනය :- ....................................

12. පරිපාලන I ශ්‍රේණියට උසස් කළ දිනය :- ....................................

13. විශේෂඥ ශ්‍රේණියට උසස් කළ දිනය :- ........................................

14. දැනට දරණ තනතුර හා ඊට පත් වූ දිනය :- ..............................................................................

15. පශ්චාත් උපාධි ඩිප්ලෝමා / විද්‍යාපති / දර්ශනවේදී / (වෛද්‍ය විශාරද) අධ්‍යයන මණ්ඩල සහතික ලබා නොමැති / (වෛද්‍ය විශාරද) අධ්‍යයන මණ්ඩල සහතික ලබා ඇති / දර්ශනපති පිළිබඳව තොරතුරු:-

| පශ්චාත් උපාධි ඩිප්ලෝමා / විද්‍යාපති / දර්ශනවේදී / (වෛද්‍ය විශාරද) අධ්‍යයන මණ්ඩල සහතික ලබා නොමැති / (වෛද්‍ය විශාරද) අධ්‍යයන මණ්ඩල සහතික ලබා ඇති / දර්ශනපති | ලබා ගත් ආයතනය | කාල සීමාව | සුදුසුකම් සපුරා ඇති දිනය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

16. ආසන්න වසර 05ක වාර්ෂික කාර්ය සාධනය අනුව අවසාන ඇගයීම :-

| වර්ෂය | අවසාන ඇගයීම<br>විශිෂ්ඨයි / සාමාන්‍ය ප්‍රමාණයට වඩා ඉහලයි / සතුටුදායකයි / අසතුටුදායකයි |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |

CamScanner

17. ජාත්‍යන්තර මට්ටමේ සඟරාවල ශාස්ත්‍රීය පර්යේෂණ / ප්‍රකාශන හෝ ශ්‍රී ලංකා ග්‍රන්ථ ප්‍රකාශන මණ්ඩලයේ අනුමැතිය සහිත ප්‍රකාශයට පත්කරන ලද ග්‍රන්ථ සඳහා :-
..............................................................................................................................
..............................................................................................................................
..............................................................................................................................

18. ලබා ඇති දේශීය හා විදේශීය පුහුණු පිළිබඳ තොරතුරු :-
..............................................................................................................................
..............................................................................................................................
..............................................................................................................................
..............................................................................................................................

19. භාෂා කුසලතා :-
..............................................................................................................................
..............................................................................................................................
..............................................................................................................................

20. විශේෂ සුදුසුකම් :-
..............................................................................................................................
..............................................................................................................................
..............................................................................................................................

21. වෙනත් තොරතුරු :-
..............................................................................................................................
..............................................................................................................................
..............................................................................................................................
..............................................................................................................................

22. ලබා ඇති වැටුප් රහිත නිවාඩු පිළිබඳ විස්තර :- ...................................................
..............................................................................................................................
..............................................................................................................................

මෙම අයදුම්පතේ මා විසින් සපයා ඇති සියලු තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් ප්‍රකාශ කරමි.

දිනය :- ....................................

..................................................
අයදුම්කරුගේ අත්සන

<u>ආයතන ප්‍රධානියාගේ නිර්දේශය :-</u>

........................................................................ ලෙස සේවය කරන ........................................................ (සේවය)............. ශ්‍රේණියේ ...................................................මහතා / මිය පූර්වාසන්න වර්ෂ 05ක සියලු වැටුප් වර්ධක උපයා ඇති / නැති බවත්, පූර්වාසන්න වර්ෂ 05ක කාලයේ දී නිලධාරියාට/ නිලධාරිනියට විරුද්ධව විනයානුකූල කටයුතු සිදුකර ඇති / නැති බවත්, ඉදිරියේ දී නිලධාරියාට / නිලධාරිනියට විරුද්ධව විනයානුකූල කටයුතු කිරීමට අදහස් කර ඇති / නොමැති බවත් සහතික කරමි. ඉහත සඳහන් තනතුරට ඔහු / ඇය සුදුසුකම් ලබන / නොලබන බව සඳහන් කරන අතර, ඒ අනුව අයදුම්පත නිර්දේශ කරමි./ නොකරමි.

දිනය :- ..................................................

..................................................................
ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව

CamScanner

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය :-**

............................................................ ලෙස සේවය කරන ............................................................
(සේවය).............ශ්‍රේණියේ .......................................................මහතා / මිය පූර්වාසන්න වර්ෂ 05ක සියලු වැටුප් වර්ධක උපයා ඇති / නැති බවත්, පූර්වාසන්න වර්ෂ 05ක කාලයේ දී නිලධාරියාට/ නිලධාරිනියට විරුද්ධව විනයානුකූල කටයුතු සිදුකර ඇති / නැති බවත්, ඉදිරියේ දී නිලධාරියාට / නිලධාරිනියට විරුද්ධව විනයානුකූල කටයුතු කිරීමට අදහස් කර ඇති / නොමැති බවත් සහතික කරමි. ඉහත සඳහන් තනතුරට ඔහු / ඇය සුදුසුකම් ලබන / නොලබන බව සඳහන් කරන අතර, ඒ අනුව අයදුම්පත නිර්දේශ කරමි./ නොකරමි.

දිනය..................................

.............................................................................

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රව

**අමාත්‍යාංශ ලේකම්ගේ / ප්‍රධාන ලේකම්ගේ නිර්දේශය :-**

............................................................ ලෙස සේවය කරන ............................................................
(සේවය).............ශ්‍රේණියේ .......................................................මහතා / මිය පූර්වාසන්න වර්ෂ 05ක සියලු වැටුප් වර්ධක උපයා ඇති / නැති බවත්, පූර්වාසන්න වර්ෂ 05ක කාලයේ දී නිලධාරියාට/ නිලධාරිනියට විරුද්ධව විනයානුකූල කටයුතු සිදුකර ඇති / නැති බවත්, ඉදිරියේ දී නිලධාරියාට / නිලධාරිනියට විරුද්ධව විනයානුකූල කටයුතු කිරීමට අදහස් කර ඇති / නොමැති බවත් සහතික කරමි. ඉහත සඳහන් තනතුරට ඔහු / ඇය සුදුසුකම් ලබන / නොලබන බව සඳහන් කරන අතර, එම තනතුරට බඳවා ගනු ලැබුවහොත් ඔහු / ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කල හැකි බවද නිර්දේශ කරමි / නොකරමි.

දිනය :- ...............................

.............................................................................

අමාත්‍යාංශ ලේකම්ගේ / ප්‍රධාන ලේකම්ගේ
අත්සන හා නිල මුද්‍රාව

CamScanner